www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පෝල්සන් හා ගෝල්ඩ්මන් සැක්ස් සබඳතාවය වෝල් වීදියට ඇප දීම මුල්කොට ගත් කැත රහසකි

## Paulson and Goldman Sachs-A dirty secret of the Wall Street bailout

**2009 අගෝස්තු 11**

ඩොලර් ට්‍රිලියන ගනනින් වෝල් වීදියට ඇප බැඳීම පිටුපස, ආන්ඩුවේ නිලධාරීන් හා බැංකු අතර පැවති දූෂිත සබඳකම් මැන බැලීම සඳහා එලියක් විහිදුවන ලිපියක් අගෝස්තු 9 වන දින නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රයේ පලවිය. එහි අන්තර්ගතව තිබුනේ ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් යටතේ භාන්ඩාගාර ලේකම්ව සිටි හෙන්රි පෝල්සන් හා, බුෂ් පරිපාලනයට එක් වීමට පෙර ඔහු ප්‍රධානත්වය දැරූ යෝධ ආයෝජන බැංකුවක් වන ගෝල්ඩ්මන් සැක්ස් අතර තිරයට පිටුපස පැවති ගනුදෙනු ය.

2007-2008 වසරවල පෝල්සන්ගේ නිල දින සටහන් මත පදනම්වූ ලිපිය, ටයිම්ස් පත්‍රය ලබාගෙන ඇත්තේ නිදහස් තොරතුරු වාර්තාකරනය පිලිබඳ අධිකරන නියෝගයක් මතය. මූල්‍ය අර්බුදය පැවති පසුගිය දෙවසරක කාලය තුල පෝල්සන් හා ගෝල්ඩ්මන් හි ඔහුගේ අනුප්‍රාප්තිකයාවූ ප්‍රධාන විධායක ලොයිඩ් සී බ්ලැන්ක්ෆියන් අතර පැවති සමීප බැඳීම එමඟින් වාර්තාගත කෙරෙයි. ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් (ඒඅයිජී) යන බිඳ වැටෙමින් පැවති රක්ෂන හා මූල්‍ය සමාගමට ඇපදීම සඳහා ඩොලර් බිලියන 85 ක් යෙදවීමට ආන්ඩුව තීරනය කල, අර්බුදයේ උච්ඡතම අවස්ථාව වූ 2008 සැප්තැම්බර් මැද භාගය කෙරෙහි එය අවධානය යොමු කරයි.

ඒඅයිජී ගලවාගැනීමේ හදවතෙහි ම පැවතියේ, ඒඅයිජී සමඟ වෝල් වීදියේ බැංකු ඇති කර ගෙන තිබූ නය පැහැර හැරීම් පිලිබඳ රක්ෂන ගිවිසුම් අනුව එම රක්ෂන සමාගම විසින් ගෙවිය යුතුව තිබුනු ඩොලර් බිලියන ගනනක් ආවරනය කිරීමට ඩොලරයෙන් ඩොලරය බදු ගෙවන්නන්ගේ අරමුදල් යෙදවීමට ගත් තීන්දුවක් බව ලිපිය අනාවරනය කරයි. නය පැහැරහැරීමේ ආවරන, බැංකු සිය දැවැන්ත ලාභ අත්කර ගැනීමේ දී මෙන්ම තම ඉහල විධායකයන්ට හා ගනුදෙනු කරුවන්ට ඩොලර් මිලියන ගනනින් ප්‍රතිලාභ හා වැටුප් පොදි පිරිනැමීමේ දී පදනම්ව සිටි සුවිශාල සමපේක්ෂන ව්‍යුහය තුල ප්‍රමුඛ භූමිකාවක් ඉටුකලේ ය.

ප්‍රති නියාමන නය පැහැර හැරීමේ ආවරන රක්ෂන වෙලඳපොලේ අර්ථය වූයේ, වෙනත් බැංකු හා සමාගම් විසින් නිකුත්කල බැඳුම්කර පැහැර හැරීමට එරෙහිව, බැංකු හා සංගත වලට රක්ෂන ආවරන ලබා දීමයි. ඒඅයිජී එයට සම්බන්ධ විශාලතම ආයතනය විය. එවන් රක්ෂන ආවරන අලෙවිකරන්නා බංකොලොත් වුව හොත් අනෙක් පාර්ශවය බිලියන ගනන් පාඩු ලැබීමට හා බංකොලොත් වීමට මුහුනදෙයි. ඒඅයිජී බිඳවැටීමේ අද්දර රැඳී සිටි 2008 සැප්තැම්බරයේ, ප්‍රධාන මූල්‍ය සමාගම් වල තත්ත්වය හරියටම එසේ විය. පෝල්සන්ගේ ප්‍රකාශිකාව වූ මිෂෙල් ඩේවිස්ගෙන් ටයිම්ස් පත්‍රය උපුටා දක්වයි. සතිය අවසන්වන විට ගෝල්ඩ්මන් මෙන්ම මෝගන් ස්ටැන්ලි ආයෝජන බැංකුව ද "බිඳවැටීමේ අනතුරට මුහුනපා ඇතැයි" ආන්ඩුවේ නිලධාරින් කලබලයට පත්ව සිටි බව ඇය පැවසුවාය.

ඒඅයිජී සමග ඇති කර ගෙන තිබූ නය පැහැරහැරීමේ රක්ෂන ආවරන හා අනෙකුත් ව්‍යුත්පන්න වලින් බිලියන 13 ක අලාභයකට මුහුනපා සිටි වෝල් වීදියේ ආයෝජන ආයතන අතුරින් විශාලතම හා වඩාත් ලාභදායි

ගෝල්ඩ්මන් සැක්ස් තරම්, අන් කිසිදු සමාගමක් එවන් තත්ත්වයකට අනාවරනය වී තිබුනේ නැත.

පෝල්සන් ප්‍රධානත්වය දැරූ එම බැංකුව සමඟ අයුතු සම්බන්ධකම් පැවැත්වීම නීතියෙන් හා ආචාර ධර්ම වලින් තහනම්ව තිබිය දී, පෝල්සන් හා ෆෙඩරල් රිසර්ව් මහ බැංකුව විසින් ඒඅයිජී ඇපදීම නිවේදනය කරනු ලැබූ 2008 සැප්තැම්බර් හා ඒ ආසන්න දිනවල, ඔහු බ්ලැන්ක්ෆියන් සමඟ දුරකථන සාකච්ඡා දුසිම් ගනනක් පැවැත්වීමේ කාරනය ලිපියෙන් වාර්තාගත කර තිබේ.

පෝල්සන් ද, එවකට නිව් යෝර්ක් ෆෙඩරල් රිසර්ව් බැංකුවේ සභාපතිව සිටි හා දැන් ඔබාමා පාලනාධිකාරයේ භාන්ඩාගාර ලේකම්ව සිටින තිමෝති ගේත්නර් හා දැන් ෆෙඩරල් මහබැංකුවේ සභාපතිව සිටින බෙන් බර්නන්කේ ඇතුලු බැංකු ඇපදීම් හුවා දැක්වූ ඔහුගේ සහකරුවෝ, මහජන අරමුදලින් ගෝල්ඩ්මන් මුදාගැනීමෙහිලා පෝල්සන්ගේ භූමිකාවේ නීතිමය ප්‍රතිවිපාක ගැන හොඳින්ම දැන සිටියහ.

*ටයිම්ස්* වාර්තා කරන පරිදි, තමන් සඳහා නීතිමය කඩතුරාවක් සපයා ගැනීමේදී, බර්නන්කේ, ගේත්නර් හා අනෙකුත් බැංකු නියාමකයන් සමඟ ගෝල්ඩ්මන් හි මූල්‍ය අර්බුදය පිලිබඳව සාකච්ඡා කිරීම සඳහා තමා ද සම්බන්ධ සමුලුවකට ආරාධනා ලැබීමට මඳකට පෙරාතුව සැප්තැම්බර් 17 වන දින, මෙරිල් ලින්ච් හා මෝගන් ස්ටැන්ලි යන බැංකු ආචාර ධර්ම බැඳීම් වලින් නිදහස් කල බවට වූ ප්‍රකාශ දෙකක් පෝල්සන් අතට පත් විය. එම ප්‍රකාශ නිකුත් කරනු ලැබුවේ පෝල්සන්ගේ භාන්ඩාගාර දෙපාර්තමේන්තුව හා බුෂ් ගේ ධවල මන්දිර කාර්යාලයෙනි.

*ටයිම්ස්* වාර්තා කල පරිදි, "2008 සැප්තැම්බර් 16-21 අතර කාලයේ පෝල්සන් හා බ්ලැන්ක්ෆියන් 24 වතාවක් කථාබස් කර තිබීම තුලින් සියල්ල ප්‍රකාශිතය. පෝල්සන්ගේ කාල සටහන් වාර්තා වලට අනුව ඔහු, වෙනත් කිසිදු විධායකයෙකු සමඟ කථාකරනවාට වඩා බොහෝසෙයින් බ්ලැන්ක්ෆියන් සමඟ කථාබස්කොට ඇත."

කිසිදු ආචාර ධර්ම ප්‍රකාශනයක් ලැබීමට පූර්වයෙන් පෝල්සන්, ඔහු කලින් සිටි බැංකුවට අසමානුපාතික ලෙස වාසි සැලසෙන පරිදි එලඹුනු තීරනවල දී ප්‍රධාන භූමිකාවක් ඉටුකර තිබෙන බව පුවත්පත වාර්තා කරයි. ඊට අමතරව, ආන්ඩුවේ මූල්‍ය පහසුකම් සඳහා තවත් ඉඩ ලැබෙන පරිදි, ආයෝජන බැංකුවක සිට වානිජ්‍ය බැංකුවක් බවට නීත්‍යානුකූලව පරිවර්තනය වීමට ගෝල්ඩ්මන්ට අවකාශ සැලසීමත්, ගෝල්ඩ්මන් හි තරගකරුවන් වූ බෙයා ස්ටියර්න්ස් හා ලේමන් බ්‍රදර්ස් ද ඉන් ඉක්බිත්තෙහි මෙරිල් ලින්ච් ද අතුගා දැමීම හා, කෙටි කලකින් විකුනා දැමීම මඟින් ගෝල්ඩ්මන් හි කොටස් සඳහා ඔට්ටු ඇල්ලීමෙන් ආයෝජකයන් වලක්වන සුරකුම් හා හුවමාරු කොමිසමේ නියෝගයක් ලබාගැනීම ද ඇතුලු කාරනා ඉවහල්කර ගැනීම මඟින්, ගෝල්ඩ්මන් හි බොල් නය ආවරන රක්ෂන ඒඅයිජී වෙතින් ලබාගෙන තිබුනි.

ඩොලර් ට්‍රිලියන ගනන් මුදල් ද, නොමිලේ ම පාහේ පිරිනැමෙන නය, නය සුරකුම් හා බදු ගෙවන්නන්ගෙන් සලසා ගන්නා වෙනත් සහන පදනම්කර ගන්නා එවන් පියවර, ඔබාමා පාලනය විසින් ද දිගටම ගෙනයමින් තව දුරටත් පුලුල් කර ඇත. වෝල් වීදියේ ප්‍රමුඛ බැංකු මේ වසර තුල සැලකිය යුතු ලාභ හිමිකරගෙන ඇති අතර සිය ඉහල විධායකයන්ට හා ගනුදෙනු කරුවන්ට ඉලක්කම් හතේ අටේ වන්දි ප්‍රධානය සඳහා දැවැන්ත, සමහර විට වාර්තාගත, මුදල් ප්‍රමානයන් වෙන්කරගෙන ඇත.

ගෝල්ඩ්මන් තරම් අන් කවරෙකු වත් සාර්ථක වී නැත. එය දෙවන කාර්තුව සඳහා වාර්තාගත බිලියන 3.44 ක ලාභයක් උපයා ඇති අතර වාර්තාගත බිලියන 22 ක් එහි සේවකයන් සඳහා මේ වසරේ වැටුප් හා ප්‍රසාද මුදල් ගෙවීම සඳහා වෙන්කරගෙන තිබේ.

නීති හා ආචාර ධර්ම උල්ලංඝනය කිරීමට අමතරව පෝල්සන්, පසුගිය මාසයේ දී නියෝජිත මන්ත්‍රී මන්ඩල කමිටුවක් හමුවේ

තම පක්ෂපාතකම ගැන දිව්රුම්දී තිබිය හැකි බවට ද ලිපියෙන් අදහස් පලකර තිබේ. ඔහු ඒඅයිජී හා ගෝල්ඩ්මන් සමග සිදුකල ගනුදෙනුවල දී ආසක්තයන් අතර ගැටුම් හටගැනීමට පැවති හැකියාව මත ඔහුට අභියෝග කල විට, හිටපු භාන්ඩාගාර ලේකම් කමිටුවට මෙසේ පැවසීය. "ඒඅයිජී හි කිසිදු නය හිමියෙකුට හෝ ප්‍රති පක්ෂයකට ගෙවීම් කිරීම සම්බන්ධ මහ බැංකුවේ කිසිදු තීරනයක දී මා කිසිදු අයුරකින් සම්බන්ධවී නැති බව ඔබ දැන සිටීම අවශ්‍යය."

එහෙත් නම සඳහන් නොකල හිටපු ආන්ඩුවේ නිලධාරියෙකු පැවසූ බවට *ටයිම්ස්* වාර්තා කලේ "2008 සැප්තැම්බර් 13-14 දිනවල සති අන්තයේ පැවති ඒඅයිජී මුදා ගැනීමේ සාකච්ඡාවල දී පෝල්සන් මහතා ප්‍රධාන ක්‍රියා කලාපයක් ඉටුකල බවත්, ඒඅයිජී වෙත පිරිනැමෙන නය මුදල, ගෝල්ඩ්මන් හා රක්ෂන සමාගමේ අනෙකුත් ගනුදෙනු කරුවන්ට ගෙවීම සඳහා යොදාගන්නා බවට, සාකච්ඡාවලට සහභාගී වූවන් අතර මනා වැටහීමක් තිබුනි" යනුවෙනි.

තවත් බැරෑරුම් කාරනයක් ගැන සඳහන් කිරීමෙන් පුවත්පත වැලකී සිටියි. පෝල්සන් පුද්ගලිකව ම ඒඅයිජී ප්‍රධාන විධායක නිලධාරියා ඉවත් කර ඒ වෙනුවට එඩ්වර්ඩ් එම් ලිඩී පත්කල බව *ටයිම්ස්* සටහන් කරයි. වයිකිපීඩියාවට අනුව, බදු ගෙවන්නන්ගේ මුදල් ඒඅයිජී හරහා ගෝල්ඩ්මන් හා ඒඅයිජී නය හිමියන් වෙත ලබාදීම සඳහා පෝල්සන් විසින් තෝරාගත් පුද්ගලයා, "ඒඅයිජී හි ප්‍රධාන විධායක ලෙස වැඩ භාරගැනීමට සිය ධුරයෙන් ඉල්ලා අස්වන තෙක්ම 2003-2008 අතර කාලයේ ගෝල්ඩ්මන් හි අධ්‍යක්ෂ මන්ඩලයේ සිටි අයෙකි. එම ධුර දෙක සඳහා ම ඔහු තෝරාගනු ලැබුවේ පෝල්සන් විසිනි." ඒඅයිජී තනතුරෙන් ඉවත්වන අවස්ථාව වන විට ලිඩීට ගෝල්ඩ්මන් හි මිලියන 3 කට වැඩි වටිනාකමකින් යුත් කොටස් 27,000 ක් හිමිව තිබුනි.

ඔබාමා කෙරෙහි වන දේශපාලන සහයෝගය පිලිබිඹු කරමින් *ටයිම්ස්* පත්‍රය පහත සඳහන් කරුනු මඟහරියි, එනම්, ගෝල්ඩ්මන් හි හිටපු ප්‍රධාන විධායකයෙකු වූ රොබට් රූබින් හා තවත් දෙදෙනෙක් ගැන පමනක් සඳහන් කලොත්, හිටපු ගෝල්ඩ්මන් උප සභාපති ද අර්බුදයට පත් බැංකු වත්කම් සුරැකීමේ වැඩසටහනෙහි පරිපාලකයා වූ නීල් කැෂ්කාරි හා ඔබාමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක වන ලෝරන්ස් සමර්ස් වැනි ඉහලම මට්ටමේ අයගෙන් වත්මන් පරිපාලනය පිරී ඇති බවයි. එසේම එම ලිපිය, වත්මන් භාන්ඩාගාර ලේකම් හා ඒඅයිජී ඇපදීම සංවිධානය කල ප්‍රමුඛයෙක් වන ගේත්නර්, නමින් සඳහන් කිරීමට ද අසමත් ය.

ගෝල්ඩ්මන් සූදුකෙලිය නය කන්ද ගෙවාදැමීමට භාන්ඩාගාරය කොල්ලකෑම සඳහා මූලිකත්වය ගනිමින්, වඩාත් පොදුවේ මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ සමපේක්ෂන වැඩ කටයුතු වල ප්‍රතිවිපාකයන්ගෙන් ඔවුන් ආවරනය කිරීමෙහි ලා පෝල්සන් ඉටුකල භූමිකාව, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සාපරාධී ය. විභවාත්මක නීති කඩකිරීමට අමතරව ඔබාමා විසින් තව දුරටත් ඉදිරියට ගෙන යන, ඔහුගේ ප්‍රතිපත්ති, එක්සත් ජනපදයේත් ලොව පුරාත් මිලියන සිය ගනනක් මිනිසුන්ට අත්කරදී තිබෙන ගිනිය නොහැකි විනාශකාරී සමාජ ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගත් කල, අපරාධ පරීක්ෂනයක් පැවැත්වීමට අවශ්‍ය සෑම පදනමක්ම ඒ තුල පවත්නේය.

කෙසේ වෙතත් පෝල්සන් සුවිශේෂයක් නොවේ. ඒ වෙනුවට, දශලක්ෂපති බැංකු කාරයෙක් කැබිනට් නිලධරයෙකු වීම වනාහි, කැරකෙන දොරකින් ව්‍යාපාරික පරිශ්‍රයේ හා රාජ්‍යයේ ඉහලම නිලතල අතර කරක්ගැසීමට අවස්ථාව හිමිකරගත් මූල්‍ය කතිපයාධිකාරයේ ප්‍රමුඛයන් විසින්, සමාජ හා දේශපාලන ජීවිතයේ අධිකාරය දැරීම පිලිබඳ මූර්තියක් පමනකි. ප්‍රතිගාමිත්වයේ මෙම අශෝභන අස්පගාල හා දූෂනය පිරිසිදු කල හැක්කේ විප්ලවවාදී සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තියේ ස්වාධීන පෙලගැසීමක් තුලින් පමනි.

බැරී ග්‍රේ

© www.wsws.org